[Public]



# විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ශ්‍රම සංක්‍රමණයෙහි කාර්තුමය විවරණිකාව

**1 වන කාර්තුව - 2023**

**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ප්‍රධාන කරුණු ....

- 2021 වසරේ අප්‍රේල් මාසයේ සිට ඉහළම අගය වාර්තා කරමින්, 2022 වසරේ මාර්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 318.4ට සාපේක්ෂව, 2023 වසරේ මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 568.3ක් දක්වා ඉහළ ගියේය.
- 2023 වසරේ පළමු කාර්තුව තුළ දී ලැබුණු සමස්ත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 1,413.2ක් විය.
- 2023 වසරේ පළමු කාර්තුව තුළ දී වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇත්තේ කුවේට්, කටාර් සහ එ.අ. එමීර් රාජ්‍යය යන රටවල් වලිනි.
- 2023 වසරේ පළමු කාර්තුව තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑම ඉහළ ගොස් ඇති අතර, එහි මාසික සාමාන්‍ය සංක්‍රමණිකයන්ගේ ප්‍රමාණය 25,366ක් විය.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි වර්ධනයන්

**රූප සටහන 1: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මාසික වෙනස්වීම**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**රූප සටහන 2: වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2022 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 261ක මාසික සාමාන්‍යයට සාපේක්ෂව, 2023 වසරේ පළමු කාර්තුවේ දී එ.ජ. ඩොලර් මිලියන 471ක මාසික සාමාන්‍යයක් වාර්තා කරමින් තවදුරටත් වර්ධනය විය.**

**රූප සටහන 3: ගමනාන්ත රට අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් (ජනවාරි-මාර්තු 2023) (අ)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**රූප සටහන 4: ගමනාන්ත රට අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීමේ ව්‍යාප්තිය (ජනවාරි-මාර්තු 2023)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**වැඩිම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණයක් කුවේට්, කටාර්, එ.අ. එමීර් රාජ්‍යය සහ සවුදි අරාබිය යන රටවලින් ලැබී ඇත.**

(අ) අනෙකුත් රටවලින් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 167.7ක සහ ඇතැම් ගෝලීය ප්‍රේෂණ මාර්ග, ජංගම යෙදුම් (Mobile Apps) සහ වෙනත් මාර්ග හරහා ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 268.4ක විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට අනුව බෙදා වෙන්කිරීමේ දී මෙහි ඇතුළත් නොවේ.

**රූප සටහන 5: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම්**
**ජනවාරි-මාර්තු (2020 - 2023)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

**රූප සටහන 6: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මාසික සාමාන්‍යය**
**ජනවාරි-මාර්තු (2020 - 2023)**




*මූලය: බලපත්‍රලාභී බැංකු*

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සහ විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ක්‍රියාකාරිත්වය

**රූප සටහන 7: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්වීම්**




*මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ රැකියා සඳහා පිටත්වීම් වැඩිවීමට අනුරූපව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීමේ ප්‍රගතියක් මෑත මාසවල දක්නට ලැබුණි.**

## විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන්ගේ පිටත්ව යෑම්වල වර්ධනයන්

**රූප සටහන 8: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික වෙනස්වීම**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 9: ගමනාන්ත කලාපය අනුව පිටත්වීම් (ජනවාරි-මාර්තු 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2022 වසරේ පළමු කාර්තුව හා සසඳන විට 2023 වසරේ පළමු කාර්තුව තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු ප්‍රමාණය බොහෝදුරට සමාන අගයක පැවතිණි.**

**විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන්ගෙන් බහුතරයක් මැද පෙරදිග කලාපයට (78.6%) වන නමුත් එය 2022 වසරේ සිව්වන කාර්තුවට (84.7%) වඩා අඩු විය.**

**රූප සටහන 10: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ප්‍රවණතාවය ජනවාරි-මාර්තු (2020 - 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 11: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික සාමාන්‍යය ජනවාරි-මාර්තු (2020 - 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

## රැකියා මට්ටම් අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම්: ජනවාරි-මාර්තු 2023

**රූප සටහන 12: ස්ත්‍රී පුරුෂ භාවය සහ රැකියා වර්ගය අනුව පිටත්වීම් සංඛ්‍යාව (ජනවාරි-මාර්තු 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 13: රැකියා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්වීමේ සංයුතිය (ජනවාරි-මාර්තු 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ රැකියා සඳහා පිටත්ව යන කාන්තා සේවිකාවන් අර්ධ පුහුණු කාණ්ඩය කෙරෙහි වැඩි වශයෙන් යොමු වී ඇති අතර, පිරිමි සේවකයන් පුහුණු කාණ්ඩය කෙරෙහි වැඩි වශයෙන් යොමු වී ඇත.**

**විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සමස්ත සේවා නියුක්තිකයන්ගෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් යොමු වී ඇත්තේ අර්ධ පුහුණු සහ නුපුහුණු කාණ්ඩ වෙත වේ.**

## ස්ත්‍රී පුරුෂ භාවය සහ රට අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම්වල ප්‍රවණතාවය: ජනවාරි-මාර්තු 2023

**රූප සටහන 14: ගමනාන්ත රට සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පිටත්වීම් (ජනවාරි-මාර්තු 2023)**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

## වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම් : ජනවාරි-මාර්තු 2023

**රූප සටහන 15: වයස අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**රූප සටහන 16: ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්**




*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පිරිමි ශ්‍රමිකයින්ගෙන් වැඩිම ප්‍රමාණයක් (20%) වයස අවුරුදු 30 -34 කාණ්ඩවල පසුවන අතර, වැඩිම කාන්තා ශ්‍රමිකයින් ප්‍රමාණයක් (21%) වයස අවුරුදු 40 - 44 කාණ්ඩයේ පසු වේ.**

## සමස්ත පිටත්වීම් (විදේශ රැකියා සඳහා පිටත්වීම් ද ඇතුළුව) සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම්

**රූප සටහන 17: ශ්‍රී ලංකාවෙන් සිදු වූ සමස්ත පිටත්වීම් (මාසිකව)**




*මූලය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

**රූප සටහන 18: විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම් (මාසිකව)**




*මූලය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

**2023 වසරේ පළමු කාර්තුව තුළ මාසිකව පිටත් වූ සමස්ත පුද්ගලයින් ගණන ඉහළ අගයක පැවතුණි.**

**විදේශ රැකියා සඳහා පිටත් වූ සමස්ත පුද්ගලයින් ගණන ඉහළ යාමත් සමඟ, 2023 වසරේ පළමු කාර්තුව තුළ දී නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාව ද වැඩි විය.**

## විදේශ රැකියා සඳහා පිටත්වීම් සහ ශ්‍රී ලංකාවෙන් සිදු වූ සමස්ත පිටත්වීම් අතර සම්බන්ධතාව

**රූප සටහන 19: විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින් ගණන ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයින්ගේ ප්‍රතිශතයක් ලෙස**




**2022 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2023 වසරේ පළමු කාර්තුවේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින් ගණන ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයින්ගේ ප්‍රතිශතයක් ලෙස සාපේක්ෂව අඩු අගයක් ගනී.**

සටහන: සමස්ත පිටත්වීම්වලට ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සමස්ත පුද්ගලයින් ගණන ඇතුළත් වේ.

[Public]

## විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින්ගේ ඝනත්වය

**රූප සටහන 20: දිස්ත්‍රික්කය අනුව ජනගහනය 100,000කට විදේශ රැකියා සඳහා පිටත්වීම්**







*මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2021 සහ 2022 වසරවල දී සෑම දිස්ත්‍රික්කයකම ජනගහනයට සාපේක්ෂව විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයින්ගේ වැඩිම ප්‍රමාණය මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.**

## ගෝලීය සංසන්දනය

**රූප සටහන 21: 2020 සහ 2021 වසර වලදී තෝරාගත් දකුණු ආසියානු රටවල් වෙත ලැබුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




*මූලය: KNOMAD/ලෝක බැංකුව, 2022.*